International IDEA — Institute for Democracy and Electoral Assistance


Centre for Policy Alternatives

Making Social Research Count

Edinburgh Centre for Constitutional Law

# ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විෂය පථය සහ අන්තර්ගතය: මතධාරී නායකයින්ගේ අදහස්

## සමීක්ෂණයෙහි සොයාගැනීම් වල සාරාංශය



INTERNATIONAL IDEA
INSTITUTE FOR DEMOCRACY AND ELECTORAL ASSISTANCE

# ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විෂය පථය සහ අන්තර්ගතය: මතධාරී නායකයින්ගේ අදහස්

## සමීක්ෂණයෙහි සොයාගැනීම් වල සාරාංශය

© 2022 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ජාත්‍යන්තර IDEA ආයතනය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සඳහා වූ එඩින්බරෝ කේන්ද්‍රය (ECCL)

ජාත්‍යන්තර IDEA ආයතනයෙහි ප්‍රකාශන වූ කලී විශේෂිත ජාතික හෝ දේශපාලන ලැදියාවන්ගෙන් ස්වායත්ත ය. මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති අදහස් අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර IDEA ආයතනය, සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සඳහා වූ එඩින්බරෝ කේන්ද්‍රය (ECCL), ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල හෝ ඔවුන්ගේ සභාවන්හි සාමාජිකයින්ගේ අදහස් නියෝජනය නොකරයි.

මෙම ප්‍රකාශනයේ ඉලෙක්ට්‍රෝනික අනුවාදය Creative Commons Attribution-NonCommercial-ShareAlike 3.0 (CC BY-NC-SA 3.0) බලපත්‍රය යටතේ ලබා ගත හැකිය. මෙම ප්‍රකාශනය පිටපත් කිරීමට, බෙදා හැරීමට සහ සම්ප්‍රේෂණය කිරීමට මෙන්ම වාණිජමය නොවන අරමුණු සඳහා පමණක් නම් නැවත සංකලනය කිරීමට හා අනුවර්තනය කර ගැනීමට ඔබ හැකි අතර එහිදී මෙම ප්‍රකාශනය නිසි ලෙස පිළිගැනීම කරනු ලබන්නේ නම් ඔබට එය අනන්‍ය බලපත්‍රයක් යටතේ බෙදා හැරීම ද කළ හැකිය. මෙම බලපත්‍රය පිළිබඳ වැඩි විස්තර සඳහා ක්‍රියේටිව් කොමන්ස් වෙබ් අඩවියට පිවිසෙන්න: <http://creativecommons.org/licenses/by-nc-sa/3.0/>.

සැලසුම් සහ පිරිසැලසුම: ජාත්‍යන්තර IDEA ආයතනය
පිටපත් සංස්කාරක: සෝෂල් ඉන්ඩිකේටර්
DOI: <https://doi.org/10.31752/idea.2022.2>

ISBN: 978-91-7671-516-1 (PDF)

# පටුන


හැඳින්වීම ........................................................ 5

ක්‍රමවේදය ........................................................ 6

විධායක සාරාංශය ........................................................ 7

1. වත්මන් ව්‍යවස්ථාව ........................................................ 8

දැනුවත්භාවය ........................................................ 8
වෙනසක් සඳහා සහයෝගය දැක්වීම ........................................................ 9
ප්‍රතිසංස්කරණ ........................................................ 10

2. දේශපාලන ධාරාවෙහි ස්වභාවය ........................................................ 12

නායකත්වය ........................................................ 12
ප්‍රජාතන්ත්‍රවාදය ........................................................ 13
සඵලත්වය ........................................................ 13
මැතිවරණ ........................................................ 14
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීම ........................................................ 14

3. ජනාධිපති ධූරය ........................................................ 16

බලතල ........................................................ 16
ජනාධිපති ධූරයේ කාල සීමාව ........................................................ 18
සුජාතභාවය ........................................................ 18
මුක්තිය ........................................................ 20

4. ආර්ථිකයෙහි ස්වභාවය ........................................................ 21

ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ මතවාදයන් ........................................................ 21
අයිතිය (රජය සහ පුද්ගලික) ........................................................ 21
ආර්ථික පරමාධිපත්‍යය ........................................................ 22

5. මානව හිමිකම් ........................................................ 23

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ........................................................ 23
සමාජ ආර්ථික හිමිකම් ........................................................ 26

6. අධිකරණය සම්බන්ධ තත්ත්වය ....................................................................................................28

නීතිය හා සාමය පවත්වාගෙන යාම....................................................................................................28
ස්වාධීනත්වය ....................................................................................................28
කාර්ය පටිපාටික යුක්තිය ....................................................................................................29

පාර්ශවකරුවන්....................................................................................................33

ජාත්‍යන්තර **IDEA** ආයතනය ....................................................................................................33
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සඳහා වූ එඩින්බරෝ කේන්ද්‍රය **(ECCL)**....................................................................................................33
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය....................................................................................................33
සෝෂල් ඉන්ඩිකේටර් ....................................................................................................34

# හැඳින්වීම

වර්ෂ 2019 නොවැම්බර් 16 වන දින පැවැති ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය ලැබීමෙන් අනතුරුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ස්වකීය පළමු පාර්ලිමේන්තු සැසිය අමතමින්, ශක්තිමත් විධායකයක් හා ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍යය ව්‍යවස්ථාමය හා මැතිවරණ ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට පොරොන්දු විය. මෙහිදී ඔහු ප්‍රකාශ කරන ලද්දේ, දුෂ්කරතාවයකින් තොර ආණ්ඩුකරණයට, ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට සහ ආර්ථික සංවර්ධනය ඇති කිරීමට පවතින එක් ප්‍රධාන බාධකයක් නම් පසුගිය රජය යටතේ වර්ෂ 2015 අප්‍රේල් මාසයේ දී සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වන ව්‍යවස්ථා සංශෝධනය බවයි. වර්ෂ 2020 අගෝස්තු 5 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේ දී ජනාධිපතිවරයාගේ ශ්‍රී ලංකා නිදහස් පොදුජන සන්ධානය විසින් ලද සැලකිය යුතු මැතිවරණ ජයග්‍රහණය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට පැහැදිලි ජනවරමක් ලබා දෙන ලදී. ඒ අනුව, වර්ෂ 2020 ඔක්තෝම්බර් මස 22 වන දින විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමට පාර්ලිමේන්තුව විසින් කටයුතු කළ අතර එමගින් දහනව වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදුකරන ලද බොහෝ වෙනස්කම් ආපසු හරවන අන්දමට කටයුතු කිරීමත්, ඒ ඔස්සේ පාර්ලිමේන්තුව සහ අධිකරණය දුර්වල කරමින් ජනාධිපති ධූරය නැවත ශක්තිමත් කිරීමත් සිදු කරනු ලැබීය. එසේම, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක මූලික කෙටුම්පත සකස් කිරීම සඳහා සාමාජිකයන් නව දෙනෙකුගෙන් යුත් විශේෂ කමිටුවක් ද රජය විසින් පත් කරන ලදී.

මෙම සමීක්ෂණය වූ කලී ඉදිරි ව්‍යවස්ථාමය වෙනසක් සඳහා වන රජයේ සැලසුම් ද සැළකිල්ලට භාජනය කරමින් සිදු කරන ලද්දකි. මෙහි මූලික අරමුණ වූයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව ජනමතයන් ගොඩනගන්නන්ගේ දැනුම, ආකල්ප සහ මතවාදයන් ඇගයීමයි. මෙහිදී ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන පැතිකඩයන් ද්විත්වය ම අන්තර්ගත වන අන්දමට සිදු කෙරෙන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ව්‍යවස්ථාමය කාර්යසාධන ඇගයීමෙහි ප්‍රමාණාත්මක පැතිකඩ අවරණය කෙරෙන කොටස මෙම සමීක්ෂණය හරහා සිදු කිරීමට නියමිතය. එසේම, ඉදිරියේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කාර්ය සාධන ඇගයීම සිදු කරනු ලබන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ සහයෝගීතාවය සඳහා වන අන්තර්ජාතික ආයතනය හෙවත් ජාත්‍යන්තර IDEA ආයතනය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සඳහා වූ එඩින්බරෝ කේන්ද්‍රය (ECCL)ල අතර ඇති කරගත් හවුල්කාරීත්වයක් මගිනි. මෙහිදී දකුණු අප්‍රිකාවේ සහ පිලිපීනයේ ව්‍යවස්ථාවන්හි කාර්යසාධනය ඇගයීම සඳහා මීට පෙර භාවිතා කළ ජාත්‍යන්තර IDEA ක්‍රමවේදය මෙහිදී ද භාවිතා කරනු ලබයි. ශ්‍රී ලංකාවෙහි සිදු කිරීමට යෝජිත මෙකී ඇගයීමේ පරමාර්ථය වන්නේ, වර්තමාන ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ විවාදය ප්‍රජාතන්ත්‍රවාදී එකඟත්වයක් සහිත (සහ එකඟත්වයක් රහිත) වඩාත් ඵලදායී සහ ධනාත්මක කතිකාවක් වශයෙන් නැවත නිර්මාණය කිරීම උදෙසා විභව හැකියාවක් ඇති, ක්‍රමානුකූල, ප්‍රබල, සාක්ෂි පදනම් කරගත්, විශ්ලේෂණාත්මක සහ නිර්දේශයන් සඳහා එළඹිය හැකි දත්ත හා තොරතුරු ඒකරාශී කිරීමයි. මෙම ඇගයීමේ ප්‍රතිඵලයන් සිවිල් සමාජය, විද්වතුන්, මාධ්‍යය, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ දේශපාලන ක්‍රියාකාරීන් ආදී වශයෙන් වූ පාර්ශවකරුවන්ගේ භාවිතය පිණිස යොමු කරනු ඇත.

ශ්‍රී ලංකාව තුළ පුළුල් පරාසයක සමාජ-දේශපාලනික ගැටලු සම්බන්ධයෙන් වර්ෂ 1999 සිට මහජන මත විමසුම් පවත්වමින් සිටින විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය විසින් මෙම සමීක්ෂණය මෙහෙය වීම සිදු කරන ලදි. ආචාර්ය ප්‍රදීප් පීරිස්, සකීනා මොයිනුදීන් සහ එම්. ක්‍රිෂ්ණමූර්ති යන අයගෙන් මෙම සමීක්ෂණ කණ්ඩායම සමන්විත විය.

මෙම අධ්‍යයනය පුරාවට වටිනා දායකත්වයක් සහ මඟ පෙන්වීමක් ලබා දුන් ආචාර්ය පාක්‍යසෝති සරවණමුත්තු (CPA), ආචාර්ය අසංග වැලිකල (ECCL), මහාචාර්ය ටොම් ගින්ස්බර්ග් (චිකාගෝ විශ්ව විද්‍යාලය) සහ ඇමන්ඩා කැට්ස්-බැරිල් (ජාත්‍යන්තර IDEA ආයතනය) යන මහත්ම මහත්මීන්ට සහ මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සැපයු ජාත්‍යන්තර IDEA ආයතනයට ද සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය ස්වකීය ස්තුතිය පිරිනමනු ලැබේ.

# ක්‍රමවේදය

මෙම සමීක්ෂණය සිදු කරන ලද්දේ අර්ධ-ව්‍යුහගත ප්‍රශ්ණාවලියක් භාවිතයෙන්  වන අතර දිවයිනේ දිස්ත්‍රික්ත 25 පුරා ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙහි (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) ජනමතධාරී නායකයන් 400 දෙනෙකු සමඟ මුහුණට මුහුණලා සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙනි. මෙහිදී සෑම දිස්ත්‍රික්කයක් තුළම එක් එක් ජනවාර්ගික කණ්ඩායමක් සඳහා තෝරා ගත් නියැදියට ප්‍රතිචාර දැක්වූවන් වයස අවුරුදු 40 වැඩි පුද්ගලයන් වන අතර ආගමික නායකයින්, රජයේ නිළධාරීන්, ප්‍රජා මූල සංවිධානවල නිලධාරීන්, ගුරුවරුන් සහ පාසල් විදුහල්පතිවරුන් ඊට ඇතුළත් විය. මෙම නියැදියට අයත් වූ ප්‍රතිචාරකයන්ගෙන් පහෙන් හතරක් (82.2%) පිරිමි පුද්ගලයන් විය.

සමීක්ෂණයෙහි ක්ෂේත්‍ර කටයුතු ඇරඹීමට ප්‍රථමයෙන් මෙම අධ්‍යයනය පිළිබඳව, ඊට අදාල පර්යේෂණ මෙවලම සහ ක්ෂේත්‍ර ක්‍රමවේදයන් පිළිබඳව සමීක්ෂකයන්ට පුළුල් පුහුණුවක් ලබා දෙන ලදි. පර්යේෂණ මෙවලම පිළිබඳ පූර්ව-පරීක්ෂණයක් වර්ෂ 2020 දෙසැම්බර් 21 වන දින පැවැත් වුණි. එසේම, මෙහි ප්‍රධාන අධ්‍යයනය සඳහා (large-N study) අවශ්‍යය ක්ෂේත්‍ර උපදෙස් ලබා දීම වර්ෂ 2020 දෙසැම්බර් 22-23 යන දෙදින තුළදී සිංහල හා දෙමළ මාධ්‍ය සමීක්ෂකයන් සමඟ පවත්වන ලදී. මෙම අධ්‍යයනයට සියලුම ජනවාර්ගික ප්‍රජාවන්ගෙන් යුත් ස්ත්‍රී සහ පුරුෂ නියෝජනය සහිත ක්ෂේත්‍ර සමීක්ෂකයන් 64 දෙනෙක් සහභාගී විය. එසේම, මෙහි ක්ෂේත්‍ර කටයුතු වර්ෂ 2020 දෙසැම්බර් 24 වන දින ආරම්භ කර වර්ෂ 2021 ජනවාරි 23 වන දිනෙන් අවසන් කරන ලදි. මෙම අධ්‍යයනය සඳහා එක්රැස් කරන ලද දත්තවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍ර කටයුතු අතරතුරදී මෙන්ම ඉන්පසුව සිදුකරන පසු විපරම් පරීක්ෂාවන් ද සිදු කරන ලදි. මෙහි දත්ත සමාජ විද්‍යාවන් සඳහා භාවිතා වන සංඛ්‍යාන පැකේජය (Statistical Package for Social Sciences-SPSS) භාවිත කරමින් විශ්ලේෂණය කරනු ලැබ ඇත.

# විධායක සාරාංශය

- මෙම සමීක්ෂණයට ප්‍රතිචාර දැක් වූ මතධාරී නායකයන් බහුතරයකගේ (53%) අදහස වන්නේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අත්‍යවශ්‍ය වෙනස්කම් කිහිපයක් සමඟින් එය ඉදිරියට පවත්වාගෙන යා යුතු බවය.
- සිංහල ප්‍රජාව නියෝජනය කළ මතධාරී නායකයින් පෙන්වා දෙනු ලබන ආකාරයට, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් ගත්කල, වැඩි අවධානයක් යොමු කළ යුතු වැදගත් අංග වන්නේ ආර්ථික සමෘද්ධිය සහ ජාතික ආරක්ෂාවයි. එසේම, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්, මතධාරීන් පෙන්වා දෙනු ලබන්නේ ආර්ථික සමෘද්ධි, ජාතික ආරක්ෂාව සහ බහුත්ව සමාජයක් යන්න නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් ආමන්ත්‍රණය කළ යුතු වැදගත් ම ක්ෂේත්‍රයන් බවයි.
- මෙම සමීක්ෂණයට දායක වූ ප්‍රතිචාරකයන්ගේ අදහස් අනුව ගත් කල, විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ මිශ්‍ර මතවාදයන් පවතින බව විද්‍යමාන විය. විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතු යැයි 42% කට ආසන්න පිරිසකගේ මතය වී ඇති අතර ප්‍රතිචාරකයන්ගෙන් 31% කට ආසන්න පිරිසක් ජනාධිපතිවරයා වෙත අඩු බලතල පවරමින් විධායක ජනාධිපති ක්‍රමය ඉදිරියට පවත්වාගෙන යා යුතුය යන ස්ථාවරයෙහි සිටී.
- ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තරමක් සැක සහිත බවක් ප්‍රතිචාර දැක්වූවන් තුළින් පෙන්නුම් කෙරුණි. ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් තමන් සෑහීමකට පත්වන බව 52% කට ආසන්න ප්‍රතිචාරකයන් සංඛ්‍යාවක් පෙන්නුම් කරන ලද අතර 48% කට ආසන්න ප්‍රමාණයක් ඒ පිළිබඳ සෑහීමකට පත් නොවන බව පෙන්වා දෙන ලදී.
- සමාජ අසාධාරණයන්ට එරෙහිව උද්ඝෝෂණය කිරීම හෝ විරෝධය දැක්වීම හෝ ඊට සහභාගී වීමට නිදහස ඇති බව ජනවාර්ගික ප්‍රජාවන් අතර සැළකිය යුතු ප්‍රමාණයක් විශ්වාස කරන අතර තමන්ට එසේ කිරීමට බොහෝදුරට කිසිදු නිදහසක් නොමැති බව දෙමළ ප්‍රජාව නියෝජනය කරනු ලබන මතධාරී නායකයෝ අවධාරණය කරන ලදී.
- යම් පුද්ගලයකුට තමන්ගේ චාරිත්‍ර සහ වාරිත්‍ර පිළිපැදීමට ඇති නිදහස සම්බන්ධයෙන් ගත් කල සියලු ජනවාර්ගික ප්‍රජාවන්හි මතධාරී නායකයින් බහුතරයක් ප්‍රකාශ කරනු ලද්දේ ඔවුන්ට එසේ කිරීමට නිදහස පවතින බවයි. මෙහිදී ඉස්මතු වූ විශේෂිත කරුණක් වන්නේ, ස්වකීය චාරිත්‍ර වාරිත්‍ර පිළිපැදීමට කිසිසේත් නිදහසක් නොමැති බවට මතයක් දරනු ලබන්නේ ප්‍රධාන වශයෙන්ම මුස්ලිම් ප්‍රජාවට අයත් මතවාදී නායකයෝ ය.
- ශ්‍රී ලංකාවේ අධිකරණය ස්වාධීන ද ස්වාධීන නොවේ ද යන කරුණ සම්බන්ධයෙන් ගත් කල, මතධාරී නායකයන්ගෙන් හතරෙන් එකක් (22.3%) පෙන්වා දෙනු ලබන්නේ ශ්‍රී ලංකාවේ අධිකරණය සහ විනිසුරුවන් කිසිසේත් ස්වාධීන නොවන බවයි. මෙහිදී අධිකරණය ස්වාධීනව කටයුතු කරනු ලබන්නේය යන මතයෙහි සිටින්නේ අදහස් දැක් වූ ප්‍රතිචාරකයන්ගෙන් 13% ක් පමණි.
- ශ්‍රී ලංකාවෙහි නීතිය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආයතනයන් විසින් සාධාරණය ලෙස ස්වකීය කාර්යයන් ඉටු කිරීම පිළිබඳව තත්වය සලකා බලන විට, මතධාරී නායකයින්ගෙන් හතරෙන් එකක් (1/4) පෙන්නුම් කරනු ලබන්නේ අදාළ චෝදනා ලැබූ තැනැත්තන් සුළුතර ජනවාර්ගික-ආගමික කණ්ඩායමකට අයත් වන්නේ නම්, ඔවුන් සම්බන්ධයෙන් එකී ආයතන අසාධාරණ අයුරින් කටයුතු කරනු ඇති බවයි.

# 1. වත්මන් ව්‍යවස්ථාව

## දැනුවත්භාවය

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දැනුම් මට්ටම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගතය පිළිබඳව තමන් බොහෝ දුරට දැනුවත් බව ප්‍රකාශ කරන ලද්දේ සියයට 11.1 ක මතධාරී නායකයින් පමණක් වන අතර අතිමහත් බහුතරයක් පෙන්වා දෙන ලද්දේ ඒ සම්බන්ධයෙන් තමන් තරමක් දුරට දැනුවත් බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගතය සම්බන්ධයෙන් සුළු ජාතීන් සැලකිය යුතු මට්ටමට තරමක් දුරට දැනුවත් බවක් පෙනෙන්නට තිබුණි (රූප සටහන 1).


රූප සටහන 1. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගතය පිළිබඳ දැනුවත්භාවය, ජන වර්ගය අනුව




### දේශපාලනය, පොදු කටයුතු සහ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මිනිසුන් කොතරම් දුරට දැනුවත් ද?

දේශපාලනය, පොදු කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ප්‍රතිචාරකයන් කොතරම් දුරට දැනුවත්ද යන්න ඇගයීම සඳහා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කොපමණද, පාර්ලිමේන්තුවේ දැනට වැඩිම ආසන සංඛ්‍යාවක් හිමි දේශපාලන පක්ෂය කුමක්ද, සහ පාර්ලිමේන්තුවේ වාර කාල සීමාව අවුරුදු කීයද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෑතකදී සිදුකළ අවසාන සංශෝධනය කුමක්ද සහ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දුන් වර්ෂය කුමක්ද ආදී වශයෙන් වූ ප්‍රශ්න ගණනාවක් ප්‍රතිචාරකයන්ගෙන් අසන ලදී (රූප සටහන 2).

රූප සටහන 2. පහතින් පෙන්වා දී ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු දැන සිටි ප්‍රතිචාරකයන්, ජන වර්ගය අනුව





## වෙනසක් සඳහා සහයෝගය දැක්වීම

### අපට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යද?

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ මතධාරී නායකයින්ගෙන් අඩකටත් වඩා වැඩි පිරිසකට හැඟී ගියේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යම් යම් වෙනස් කිරීම් සමඟ ඉදිරියට පවත්වාගෙන යා යුතු බව වන අතර, සියයට 37 ක් ප්‍රතිචාරකයන් විසින් පෙන්වා දෙන ලද්දේ නව ව්‍යවස්ථාවක් අවශ්‍ය බවයි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වැදගත්කම අවධාරණය කිරීමේ වැඩි ප්‍රවණතාවයක් දෙමළ සහ සිංහල ප්‍රජාවන්ට අයත් මතධාරී නායකයින්ගේ විද්‍යමාන විය (රූප සටහන 3).


රූප සටහන 3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්හි ස්වභාවය, ජන වර්ගය අනුව




### නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපට අවශ්‍ය වන්නේ ඇයි?

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හරහා ආමන්ත්‍රණය කළ යුතු වැදගත්ම කාරණා වශයෙන් සිංහල මතධාරී නායකයින් විසින් පෙන්වා දෙන ලද්දේ ආර්ථික සමෘද්ධිය සහ ජාතික ආරක්ෂාව යන කරුණුය. දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම් මතධාරී නායකයින් විසින් ප්‍රකාශ කරන ලද්දේ ආර්ථික සමෘද්ධිය සහ ජාතික ආරක්ෂාව මෙන්ම බහුත්ව සමාජයක පැවැත්ම සහතික කිරීම ඉතා වැදගත් බවයි. බහුත්වවාදී සමාජයක් සහතික කිරීම සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලද්දේ සිංහල මතධාරී නායකයින්ගෙන් සියයට 1.8 ක් පමණි (රූප සටහන 4).


රූප සටහන 4. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අරමුණ, ජන වර්ගය අනුව




## ප්‍රතිසංස්කරණ

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීම සඳහා වන රජයේ සැලසුම් පිළිබඳව තොරතුරු පෙන්වා දීමෙන් පසු, මෙම සැලසුම් පිළිබඳ තොරතුරු ජනතාවට සන්නිවේදනය කිරීමේ දී රජය සාර්ථක නොවන බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් (සියයට 48) පැවසූ අතර සියයට 40 කට ආසන්න ප්‍රමාණයක් පෙන්වා දෙන ලද්දේ එහිදී රජය යම් තරමක් සාර්ථක වී ඇති නමුත් ඊට වඩා හොඳ මට්ටමකට එය කළ හැකිව තිබූ බවය (රූප සටහන 5).

රූප සටහන 5. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම, ජන වර්ගය අනුව




නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ තොරතුරු දැනගැනීමේ දී, රූපවාහිනී ප්‍රවෘත්ති සහ දේශපාලන විවාද, පුවත්පත් සහ තමන්ගේ උගත් මිතුරන් හා අසල්වැසියන් සමඟ කතා කිරීම ප්‍රධානම තොරතුරු මූලාශ්‍ර ත්‍රිත්වය බවට මතධාරී නායකයින් විසින් පෙන්වා දුනි (වගුව 1).

වගුව 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු මූලාශ්‍ර, ජන වර්ගය අනුව

| | ජාතික | සිංහල | දෙමළ | උඩරට දෙමළ | මුස්ලිම් |
|---|---|---|---|---|---|
| මාගේ පවුලේ වැඩිහිටියන් සමඟ කතා කරනවා | 2.2% | 3.6% | 2.0% | 2.0% | 0.0% |
| මාගේ දැන උගත් මිතුරන් හා අසල්වාසීන් සමඟ කතා කරනවා | 14.4% | 10.8% | 14.1% | 6.0% | 26.1% |
| මාගේ අදහස් වලට සමීප යැයි මට හැඟෙන පක්ෂ නායකයින්ගේ මතයට සවන් දෙනවා | 6.4% | 6.0% | 4.0% | 14.0% | 5.7% |
| මාගේ ආගමේ නායකයන් විසින් ඉදිරිපත් කරන ලද මතයට සවන් දෙනවා | 1.7% | 2.4% | 1.0% | 2.0% | 1.1% |
| රූපවාහිනී ප්‍රවෘත්ති සහ දේශපාලන වාද විවාද වැඩසටහන් නරඹනවා | 36.6% | 36.5% | 37.4% | 34.0% | 37.5% |
| පුවත්පත් කියවනවා | 16.6% | 10.8% | 23.2% | 26.0% | 14.8% |
| වාර්තාවන් සහ වෙනත් මූලාශයන් ගේ සඳහන් දෑ කියවනවා | 9.9% | 16.2% | 6.1% | 6.0% | 4.5% |
| පාර්ලිමේන්තුවෙහි නිල වෙබ් අඩවියට පිවිසෙනවා | 7.7% | 7.2% | 8.1% | 6.0% | 9.1% |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමට මට අවශ්‍යතාවයක් නැත නම් | 1.0% | 0.6% | 3.0% | 0.0% | 0.0% |
| වෙනත් | 3.2% | 5.4% | 1.0% | 4.0% | 1.1% |
| නොදනී | 0.2% | 0.6% | 0.0% | 0.0% | 0.0% |
| සමස්ත ප්‍රතිචාරකයන් සංඛ්‍යාව | 404 | 167 | 99 | 50 | 88 |

# 2. දේශපාලන ධාරාවෙහි ස්වභාවය

## නායකත්වය

මෙම සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් විසින් මැතිවරණ හරහා ඡන්දයෙන් තෝරාපත්කර ගැනීමේ මූලධර්මය සඳහා අතිමහත් බහුතර සහයෝගය පළ කළ නමුත්, පාර්ලිමේන්තුව සහ මැතිවරණය මගින් බාධාවකින් තොරව පාලනය කළ හැකි විධායක නායකත්වය සඳහා ද සැලකිය යුතු සහයෝගීත්ව මතවාදයක් සෑම ජනවාර්ගික ප්‍රජාවක් තුළින්ම ඉදිරිපත් වුණි. සුළු ජාතීන්ගේ මතවාදයන්ට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පෙන්නුම් කරමින්, සමීක්ෂණයට ලක් කළ සිංහල මතධාරී නායකයින්ගෙන් තුනෙන් දෙකකට ආසන්න සංඛ්‍යාවක් හමුදා පාලනයකින් යුත් නායකත්වයකට ස්වකීය එකඟත්වය පළකර තිබුණි. ආගමික නායකත්වයක් සඳහා සෑම ජනවාර්ගික ප්‍රජාවක් තුළම පැවතියේ අවම මට්ටමක සහයක්ය. ඒ සම්බන්ධයෙන් මුස්ලිම් මතධාරී නායකයින්ගෙන් හතරෙන් එකක් එකඟත්වය පෙන්නුම් කරන විට ඊට සාපේක්ෂව සිංහල ප්‍රතිචාරකයන්ගෙන් තුනෙන් එකක් එයට සහයෝගය දැක්වූහ (වගුව 2).


වගුව 2. නායකත්ව ස්වභාවයන්, ජන වර්ගය අනුව

| | එකඟ වේ | | | | |
|---|---|---|---|---|---|
| | ජාතික | සිංහල | දෙමළ | උඩරට දෙමළ | මුස්ලිම් |
| පාර්ලිමේන්තුව හා මැතිවරණ සම්බන්ධයෙන් නොසලකා තීරණ ගත හැකි ශක්තිමත් නායකයෙකු වීම | 59.1% | 58.6% | 56.1% | 56.3% | 64.8% |
| පාර්ලිමේන්තුව සහ මැතිවරණ සම්බන්ධයෙන් නොසලකා රටට වඩාත් සුදුසු යැයි තමන්ගේ විශ්වාසයට අනුව තීරණ ගැනීමට හැකි විශේෂඥයෙකු වීම | 65.2% | 58.1% | 69.7% | 79.2% | 65.5% |
| රට පාලනය කිරීමට හමුදාව සම්බන්ට විය යුතුය | 33.1% | 62.4% | 16.3% | 10.2% | 9.2% |
| නිදහස් හා සාධාරණ මැතිවරණයක් තුළින් ජනතාව විසින් තෝරා ගනු ලබන අය රට පාලනය කළ යුතුය | 96.8% | 93.9% | 99.0% | 100.0% | 97.7% |
| රට පිළිබඳ සියලු ප්‍රධාන තීරණ ගත යුත්තේ දේශපාලඥයින්ට වඩා ආගමික නායකයින් විසිනි | 24.9% | 34.0% | 18.4% | 6.3% | 25.6% |

## ප්‍රජාතන්ත්‍රවාදය


සියලුම ජනවාර්ගික ප්‍රජාවන් නියෝජනය කළ අතිමහත් බහුතරයක් වූ මතධාරී නායකයින් විසින් කියා සිටියේ වෙනත් ඕනෑම ආකාරයක පාලනයකට වඩා ප්‍රජාතන්ත්‍රවාදයට තමන් කැමැත්තක් දක්වන බවයි. මෙම හැඟීම සුළුතර ප්‍රජාවන් අතර වඩාත් බලවත් බව විද්‍යමාන විය (රූප සටහන 6).

රූප සටහන 6. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහයෝගය දැක්වීම, ජන වර්ගය අනුව




රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ කවර අන්දමින් ද යන්න සම්බන්ධයෙන් ප්‍රතිචාරකයන් තරමක් සැක පහළ කළහ. ප්‍රතිචාරකයන්ගෙන් සියයට 52 කට ආසන්න සංඛ්‍යාවක් ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් බව පෙන්නුම් කරනු ලබන විට සියයට 48 කට ආසන්න සංඛ්‍යාවක් තෘප්තිමත් නොවන බව පෙන්වූහ. ඒ සම්බන්ධයෙන් බොහෝ දුරට තෘප්තිමත් බව පැවසූ ප්‍රතිචාරකයන් අතර උඩරට දෙමළ (සියයට 62) ද, දෙමළ (සියයට 60) සහ සිංහල (සියයට 54) මතධාරී නායකයින් වශයෙන් සිටියහ. බොහෝ දුරට තෘප්තිමත් නොවන බව පෙන්වාදුන් මතධාරී නායකයන් මුස්ලිම් ප්‍රජාව නියෝජනය කරන ලදී (සියයට 67) (රූප සටහන 7).


රූප සටහන 7. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් තෘප්තිමත්භාවය, ජන වර්ගය අනුව




## සඵලත්වය

වත්මන් දේශපාලන ක්‍රමය යටතේ රට පාලනය කරන ආකාරය කෙරෙහි බලපෑම් කිරීමට තමන්ට තරමක් දුරට ඉඩ ප්‍රස්ථාවක් ඇති බව බහුතරයක් වූ (සියයට 63.6) මතධාරී නායකයින් ප්‍රකාශ කළ ද, ඔවුන්ගෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් පෙන්වා දෙන ලද්දේ තමන්ට ඒ සම්බන්ධයෙන් කිසිදු බලපෑමක් සිදු කිරීමේ හැකියාවක් නොමැති බවයි. තමන්ට එසේ කිසිදු බලපෑමක් සිදු කිරීමේ හැකියාවක් නොමැති බව පෙන්වාදීමේ වැඩි නැඹුරුතාවයක් උඩරට දෙමළ ප්‍රජාවේ මතධාරී නායකයින්ගෙන් (සියයට 42.0) පිළිබිඹු විය (රූප සටහන 8).


රූප සටහන 8. දේශපාලනික සඵලත්වය, ජන වර්ගය අනුව




## මැතිවරණ

සියයට 45 කට ආසන්න ප්‍රමාණයක මතධාරී නායකයින් ප්‍රකාශ කර සිටියේ බොහෝ විට මැතිවරණ නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වෙන අතර මැතිවරණ කිසි විටෙකත් නිදහස්ව හා සාධාරණව නොපවත්වන බව ප්‍රතිචාරකයන්ගෙන් සියයට 16 කට ආසන්න සංඛ්‍යාවක් විසින් පෙන්වා දුනි (රූප සටහන 9).


රූප සටහන 9. කොතරම් දුරට මැතිවරණ නිදහස් හා සාධාරණ ලෙස පවත්වනු ලබන්නේ ද, ජන වර්ගය අනුව




## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදයකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ වගකීම ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරෙන බව ප්‍රතිචාරකයන්ගේ තුනෙන් දෙකකට ආසන්න සංඛ්‍යාවක් (සියයට 64.6) පෙන්වා දුන් අතර එය පාර්ලිමේන්තුවේ වගකීම බව සියයට 22 කට ආසන්න සංඛ්‍යාවක් පෙන්වා දුනි. එසේ කිරීම ජනාධිපතිවරයාගේ වගකීම යැයි විශ්වාස කරනු ලබන්නේ ප්‍රතිචාරකයන්ගෙන් සියයට 7.4 ක් පමණි (රූප සටහන 10).

රූප සටහන 10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අර්බුදයකදී, ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ වගකීම ඇත්තේ කාටද, ජන වර්ගය අනුව




# 3. ජනාධිපති ධූරය

## බලතල

විධායක ජනාධිපති ක්‍රමය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ අදහස් මිශ්‍ර ස්වභාවයකින් යුක්ත විය. ජාතික වශයෙන් වශයෙන් ගත්කල ප්‍රතිචාරකයන්ගෙන් සියයට 42 කට ආසන්න සංඛ්‍යාවක් එය මුළුමනින්ම අහෝසි කළ යුතු යැයි අදහස් කළ අතර සියයට 31 කට ආසන්න සංඛ්‍යාවක් ජනාධිපතිවරයාට අඩු බලතල සහිතව විධායක ජනාධිපති ධූරය අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බවට විශ්වාස කරන බව පෙන්වා දෙන ලදි. විධායක ජනාධිපති ක්‍රමය තවදුරටත් ශක්තිමත් කළ යුතු බව ප්‍රකාශ කරන ලද්දේ සියයට 6 ක් පමණ වන අතර එකී ධූරය කිසිදු වෙනසක් නොමැතිව එලෙසම පවත්වාගත යුතුය යන අදහසට ප්‍රතිචාරකයන්ගෙන් සියයට 18 ට අඩු ප්‍රතිශතයක් ස්වකීය කැමැත්ත පළ කරන ලදී.

ජනාධිපති ක්‍රමය පිළිබඳව ජනවාර්ගික කණ්ඩායම් අතර සැලකිය යුතු අන්දමේ වෙනස් මතයන් ඉදිරිපත් විය. ඒ අතරින් එක් විග්‍රහයකට අනුව, සිංහල මතධාරී නායකයින්ගෙන් සැලකිය යුතු බහුතරයක් විශ්වාස කරනු ලබන්නේ විධායක ජනාධිපති ක්‍රමය එක්කෝ අවශ්‍ය සුළු වෙනස්කම් කිහිපයකින් සමගින් වර්තමානයෙහි පවතින පරිදිම ඉදිරියට පවත්වාගෙන යාම හෝ එසේ නොමැති නම් එය තවදුරටත් ශක්තිමත් කළ යුතු බවටයි. කෙසේ වෙතත්, ඊට වෙනස් විග්‍රහයක් මත පදනම්ව, පැහැදිලි සිංහල බහුතරයක් වත්මන් ක්‍රමය සම්බන්ධයෙන් අතෘප්තියට පත් වී සිටිති: ප්‍රතිචාරකයන්ගෙන් සියයට 18.6 ක් එය මුළුමනින්ම අහෝසි කළ යුතු යැයි යෝජනා කළ අතර සියයට 43.1 ක් විසින් ජනාධිපතිවරයාගේ බලතල අඩු කළ යුතු බවට යෝජනා කරන ලදී. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට පැහැදිලිවම කැමැත්ත ප්‍රකාශ කරන ලද්දේ දෙමළ සහ උඩරට දෙමළ මතධාරී නායකයින් පමණි (රූප සටහන 11).

රූප සටහන 11. විධායක ජනාධිපති ක්‍රමය, ජන වර්ගය අනුව




අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ කැබිනට් මණ්ඩලයෙන් අදහස් විමසීමකින් තොරව රාජ්‍ය සේවයේ සහ ස්වාධීන කොමිෂන් සභාවන්හි ප්‍රධාන තනතුරු සඳහා පුද්ගලයන් පත් කිරීමට/ඉවත් කිරීමට ජනාධිපතිවරයාට පූර්ණ බලයක් නොතිබිය යුතු බවට ප්‍රතිචාර දැක්වූ බහුතරයක් වූ මතධාරී නායකයින් (සියයට 72.0) විසින් පෙන්වා දුනි.

බොහෝ ප්‍රතිචාර දැක්වූවන් (සියයට 76.2) ප්‍රකාශ කර සිටියේ ජනාධිපතිවරයාට ඔහු/ඇය කැමති යැයි සිතන ඕනෑම අමාත්‍යාංශ ගණනක් තමන්ගේ කාර්යයන් යටතට ගැනීමට ජනාධිපතිවරයාට නොහැකි විය යුතු බවයි. සුළු බහුතරයක් (සියයට 58.7) ප්‍රකාශ කරන ලද්දේ ඔහු/ඇය කැමති යැයි සිතන ඕනෑම අමාත්‍යාංශයක් තමන්ගේ කාර්යයන් යටතට ගැනීමට ජනාධිපතිවරයාට බලයක් නොතිබිය යුතු බවයි.

ඕනෑම අවස්ථාවක අගමැතිවරයා හෝ වෙනත් ඕනෑම ඇමතිවරයෙකු පත් කිරීමට හෝ ඉවත් කිරීමට ජනාධිපතිවරයාට පරම බලයක් තිබිය යුතුය යන අදහසට සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය වූ ප්‍රතිචාරකයන්ගෙන් තුනෙන් දෙකකට වඩා (සියයට 68.6 ක්) එකඟ නොවීය.

කෙසේ වෙතත්, සිංහල මතධාරී නායකයින්ගෙන් 43 % ක් ජනාධිපතිවරයාට මෙම අධිකාරී බලය තිබිය යුතුය යන අදහසට ස්වකීය එකඟත්වය පළ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාගේ බලතල සීමා කළ යුතු බවට මතධාරී නායකයින්ගෙන් හතරෙන් තුනකට ආසන්න සංඛ්‍යාවක් විසින් පෙන්වා දුන් අතර; මෙම මතය සුළු ජාතීන් නියෝජනය කළ ප්‍රජාවන් අතර වැඩි වශයෙන් පවතින බව පෙන්නුම් කෙරුණි (රූප සටහන 12).

වගුව 3. ජනාධිපතිවරයාට සුවිශේෂී බලතල පැවරීම සම්බන්ධයෙන් මහජන මතය, ජන වර්ගය අනුව

| | | ජාතික | සිංහල | දෙමළ | උඩරට දෙමළ | මුස්ලිම් |
|---|---|---|---|---|---|---|
| අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ අමාත්‍ය මණ්ඩලයෙන් විමසීමකින් තොරව රාජ්‍ය සේවයේ සහ ස්වාධීන කොමිෂන් සභාවන්හි ප්‍රධාන තනතුරු සඳහා පුද්ගලයින් පත්කිරීමට හෝ ඉවත් කිරීමට ජනාධිපතිවරයාට පූර්ණ බලය තිබිය යුතුය | එකඟ වේ | 23.3% | 29.9% | 16.2% | 14.0% | 23.9% |
| | එකඟ නොවේ | 72.0% | 64.1% | 78.8% | 80.0% | 75.0% |
| | නොදනී | 4.7% | 6.0% | 5.1% | 6.0% | 1.1% |
| ජනාධිපතිවරයාට ඔහු / ඇය කැමති යැයි සිතන ඕනෑම අමාත්‍යාංශයක් තමන්ගේ කාර්යයන් යටතට ගැනීමට හැකි විය යුතුය. | එකඟ වේ | 38.9% | 46.1% | 35.4% | 26.0% | 36.4% |
| | එකඟ නොවේ | 58.7% | 50.9% | 62.6% | 72.0% | 61.4% |
| | නොදනී | 2.5% | 3.0% | 2.0% | 2.0% | 2.3% |
| ජනාධිපතිවරයාට ඔහු / ඇය කැමති යැයි සිතන ඕනෑම අමාත්‍යාංශ ගණනක් තමන්ගේ කාර්යයන් යටතට ගැනීමට හැකි විය යුතුය. | එකඟ වේ | 19.8% | 29.3% | 14.1% | 12.0% | 12.5% |
| | එකඟ නොවේ | 76.2% | 65.9% | 82.8% | 84.0% | 84.1% |
| | නොදනී | 4.0% | 4.8% | 3.0% | 4.0% | 3.4% |
| ඕනෑම අවස්ථාවක අග්‍රාමාත්‍යවරයා සහ වෙනත් අමාත්‍යවරයෙක් පත්කිරීමට හෝ ඉවත් කිරීමට ජනාධිපතිවරයාට පූර්ණ බලය තිබිය යුතුය | එකඟ වේ | 28.0% | 43.1% | 16.2% | 14.0% | 20.5% |
| | එකඟ නොවේ | 68.6% | 51.5% | 81.8% | 82.0% | 78.4% |
| | නොදනී | 3.5% | 5.4% | 2.0% | 4.0% | 1.1% |
| සමස්ත ප්‍රතිචාරකයන් සංඛ්‍යාව | | 404 | 167 | 99 | 50 | 88 |


රූප සටහන 12. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ජනාධිපතිවරයාගේ බලතල සීමා කළ යුතුද යන්න පිළිබඳ අදහස්, ජන වර්ගය අනුව




## ජනාධිපති ධූරයේ කාල සීමාව

ජනාධිපති ධූරයේ කාල සීමාව උපරිම වාර දෙකකට සීමා විය යුතුය යන අදහසට තමන් වැඩි කැමැත්තක් දක්වන බව ප්‍රතිචාරකයන් විසින් පෙන්වා දෙන ලදී. මේ අන්දමින් දැක්වූ මතයෙහි සැලකිය යුතු ජනවාර්ගිකත්වය මත පදනම් වූ වෙනසක් දක්නට නොලැබිණි (රූප සටහන 13).

රූප සටහන 13. ජනාධිපති ධූරයේ කාල සීමාව පිළිබඳ මතය, ජන වර්ගය අනුව





## සුජාතභාවය


සිංහල මතධාරී නායකයින්ගෙන් අතිමහත් බහුතරයක් (සියයට 73.1) ප්‍රකාශ කර සිටියේ ජනාධිපතිවරයා සැම විටම සිංහල බෞද්ධයෙකු විය යුතු බවයි. ඡන්දයෙන් තේරී පත්වන ජනාධිපතිවරයා සඳහා ජනවාර්ගිකත්වය පූර්ව අවශ්‍යතාවක් නොවිය යුතු බව සුළු ජාතීන්ගෙන් වැඩි පිරිසක් පෙන්වා දුනි (රූප සටහන 14).

ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ සේවය කර තිබීමේ පළපුරුද්දක් තිබිය යුතු යැයි බොහෝ මතධාරී නායකයින් ප්‍රකාශ කළ ද, ප්‍රතිචාරකයන්ගෙන් හතරෙන් එකකට වැඩි පිරිසක් එය ජනාධිපති තනතුර දැරීමට පූර්ව කොන්දේසියක් වශයෙන් නොසලකන ලදී. සියලු ජනකොටස් අතර සැලකිය යුතු බහුතරයක් වූ ප්‍රතිචාරකයන් විසින් පෙන්වා දෙන ලද්දේ සියලු ජනවාර්ගික කණ්ඩායම් අතර සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ වගකීම ජනාධිපතිවරයා සතු බවයි (රූප සටහන් 15 සහ 16).


රූප සටහන 14. ජනාධිපතිවරයා සිංහල බෞද්ධයකු වීමේ පූර්ව අවශ්‍යතාවය, ජන වර්ගය අනුව




රූප සටහන 15. ජනාධිපතිවරුන්ට පූර්ව දේශපාලන අත්දැකීම් පැවතීමේ අපේක්ෂාව, ජන වර්ගය අනුව




රූප සටහන 16. රටේ විවිධ ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් අතර සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ ජනාධිපතිවරයා සතු වගකීම, ජන වර්ගය අනුව



## මුක්තිය

කිසිදු සිවිල් හෝ අපරාධ නීතිමක ක්‍රියාදාමයකින් අත්වන ප්‍රතිවිපාකයන්ගෙන් ජනාධිපතිවරයා මුක්ත නොවිය යුතු බව බහුතරයක් මතධාරී නායකයින් (සියයට 80.9) ප්‍රකාශ කරන ලදී. එකී ප්‍රමාණයටත් වඩා වැඩි බහුතරයක් වූ ප්‍රතිචාරකයන් (සියයට 86.9) පෙන්වා දෙන ලද්දේ ජනාධිපතිවරයා විසින් ඔහුගේ/ඇයගේ නිල තනතුර භාවිත කරමින් සිදු කරන හෝ නොකර හරිනු ලබන ඕනෑම ක්‍රියාවකට එරෙහිව පුරවැසියන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම උදෙසා මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට හැකියාව පැවතිය යුතු බවයි (වගුව 4).

වගුව 4. ජනාධිපතිවරයාගේ මුක්තිය, ජන වර්ගය අනුව


| | | ජාතික | සිංහල | දෙමළ | උඩරට දෙමළ | මුස්ලිම් |
|---|---|---|---|---|---|---|
| කිසිදු සිවිල් /අපරාධ නීතිමය ක්‍රියාදාමයකින් අත් වන ප්‍රතිවිපාකයකට ජනාධිපතිවරයා මුහුණ නොදිය යුතුය | එකඟ වේ | 14.9% | 9.6% | 14.1% | 12.0% | 27.3% |
| | එකඟ නොවේ | 80.9% | 85.0% | 81.8% | 82.0% | 71.6% |
| | නොදනී | 4.2% | 5.4% | 4.0% | 6.0% | 1.1% |
| ජනාධිපතිවරයා විසින් ඔහුගේ / ඇයගේ නිල තනතුර භාවිත කරමින් සිදු කරන හෝ නොකර හරිනු ලබන ඕනෑම ක්‍රියාවකට එරෙහිව පුරවැසියන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම උදෙසා මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට හැකි විය යුතුය. | එකඟ වේ | 86.9% | 83.8% | 87.9% | 90.0% | 89.8% |
| | එකඟ නොවේ | 8.9% | 9.0% | 10.1% | 8.0% | 8.0% |
| | නොදනී | 4.2% | 7.2% | 2.0% | 2.0% | 2.3% |
| සමස්ත ප්‍රතිචාරකයන් සංඛ්‍යාව | | 404 | 167 | 99 | 50 | 88 |

# 4. ආර්ථිකයෙහි ස්වභාවය

## ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ මතවාදයන්

රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා රජය විසින් පුද්ගලයන්ගේ ආදායම පාලනය නොකළ යුතු බව මතධාරී නායකයින්ගෙන් බහුතරයක් (සියයට 58 කට ආසන්න) ප්‍රකාශ කරන ලදී. කෙසේ නමුත්, ප්‍රතිචාරකයන්ගෙන් සියයට 23 කට ආසන්න පිරිසකගේ අදහස වූයේ පුරවැසියන් අතර ආදායම් පරතරය අඩු කිරීම සඳහා පුද්ගලයකුගේ ඉපැයීම් සීමා කිරීම සඳහා රජය විසින් නීති සම්පාදනය කළ යුතු බවයි. රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පුද්ගලික ආදායම පාලනය කිරීමට රජය සම්බන්ධ නොවිය යුතු බවට වන අදහස දැරීමේ වැඩි නැඹුරුතාවයක් මුස්ලිම් ප්‍රජාවේ මතධාරී නායකයන්ගෙන් (සියයට 70.5) පෙන්නුම් කෙරුණි (රූප සටහන 17).


රූප සටහන 17. පුද්ගලික ආදායම පාලනය කිරීම පිළිබඳ මතවාදයන්, ජන වර්ගය අනුව




## අයිතිය (රජය සහ පුද්ගලික)

සියලුම ජනවාර්ගික ප්‍රජා කණ්ඩායම් නියෝජනය කළ මතධාරී නායකයින්ගෙන් වැඩි කොටසක් විසින් පුද්ගලික ව්‍යවසායන්ට සාපේක්ෂව රාජ්‍ය හිමිකාරීත්වයක් සහිත ව්‍යවසායන් සඳහා වැඩි සහයක් දක්වයි (පිළිවෙලින් සියයට  31.9 සහ සියයට 42.1 වශයෙන්). පෞද්ගලික ව්‍යවසායන් සඳහා සහයෝගය දැක්වීමේ වැඩි නැඹුරුතාවයක් මුස්ලිම් මතධාරී නායකයින් තුළින් පෙන්නුම් කෙරුණි (රූප සටහන 18).


රූප සටහන 18. ව්‍යවසායන්හි හිමිකාරීත්වය පිළිබඳ මතවාදයන්, ජන වර්ගය අනුව




## ආර්ථික පරමාධිපත්‍යය

වෙළඳාමේ වැඩිවීමක් සිදුවන විට සැමට වාසි සැලසෙන නිසා අපේ රටේ ආයෝජනය කිරීමට විදේශීය සමාගම්වලට රජය විසින් ඉඩ දිය යුතු බවට සෑම ජනවාර්ගික ප්‍රජාවක්ම නියෝජනය කරමින් සමීක්ෂණයට භාජනය වූ මතධාරී නායකයින්ගෙන් අඩකට (සියයට 44.6) ආසන්න සංඛ්‍යාවක් ප්‍රකාශ කර සිටියේ වෙළඳාම සෑම කෙනෙකුටම වාසිදායක වන හෙයින් විදේශීය සමාගම්වලට මෙරට ආයෝජනය කිරීමට රජය විසින් ඉඩ ප්‍රස්ථාව ලබා දිය යුතු බවයි. රජය විසින් විදේශීය සමාගම්වලට මෙරට ආයෝජනය කිරීමට ඉඩ දිය යුතු බව දෙමළ ප්‍රජාවෙන් (සියයට 57.6 ක්) පෙන්වා දුන් අතර, උඩරට දෙමළ ප්‍රජාවෙන් (සියයට 50 ක්) විදේශ ආයෝජනයට රජය විසින් ඉඩ ප්‍රස්ථාවක් ලබා නොදිය යුතුය යන ස්ථාවරයෙහි සිටින ලදී (රූප සටහන 19).

රූප සටහන 19. විදේශ ආයෝජනයන් පිළිබඳ මතවාදයන්, ජන වර්ගය අනුව




# 5. මානව හිමිකම්

## සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

රටේ යහපත වෙනුවෙන් ක්‍රියා නොකරන්නේ යැයි රජය විසින් විස්වාස කරනු ලබන යම් සංවිධානයකට ජනතාව සම්බන්ධ වීමෙන් වළක්වාලිය යුතු යැයි මතධාරී නායකයන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් ප්‍රකාශ කරන ලදී. රජය විසින් යම් සංවිධානයක් අනුමත කරන්නේද නොකරන්නේ ද යන්න නොසලකා තමන්ට අවශ්‍ය ඕනෑම සංවිධානයකට සම්බන්ධ වීමට මිනිසුන්ට හැකි විය යුතු යැයි පැවසූ බොහෝ ප්‍රතිචාරකයන් මුස්ලිම් ප්‍රජාව නියෝජනය කරන ලදී (රූප සටහන 20).

රූප සටහන 20. සමාගමයේ යෙදීමේ නිදහස ඇගයීම, ජන වර්ගය අනුව





බහුතරයක් මතධාරී නායකයින් (සියයට 80.9) ප්‍රකාශ කරන ලද්දේ ඔවුන් සිටින ස්ථානය සහ ඔවුන් සමඟ සිටින්නේ කවුරුන්ද යන්න නොසලකා දේශපාලනය පිළිබඳ ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට නිදහස ඇති බවයි. එසේ කිරීමට තමන්ට කිසිසේත් නිදහසක් නොමැති බව පෙන්වා දීමේ වැඩි ප්‍රවණතාවයක් දෙමළ මතධාරී නායකයින්ගෙන් විද්‍යමාන විය. සමස්ත ප්‍රතිචාරකයන් නියෝජනය කළ සියලුම ජනවාර්ගික ප්‍රජාවන් අතර සැලකිය යුතු ප්‍රමාණයක් සමාජ අසාධාරණයට එරෙහි උද්ඝෝෂණයකට/විරෝධතාවයකට සහභාගී වීමට තමන්ට නිදහස ඇතැයි විශ්වාස කරනු ලබන අතර, දෙමළ ප්‍රජාවේ බහුතර මතධාරී නායකයින් පවසනු ලබන්නේ තමන්ට එසේ කිරීමට නිදහසක් කිසිසේත් නොමැති බවයි. තම සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර වලට අදාළ කටයුතු සිදු කිරීමට තමන්ට නිදහස ඇති බව සියලුම ජනවාර්ගික ප්‍රජාවන් නියෝජනය කරනු ලබන බහුතර මතධාරී නායකයින් විසින් ප්‍රකාශ කරන ලදී. මුස්ලිම් ප්‍රජාව නියෝජනය කළ ප්‍රතිචාරකයින් බොහෝ දුරට පෙන්වා දුන් පරිදි ඔවුන්ට එසේ කිරීමට කිසිසේත් නිදහසක් නැති බව ගම්‍ය විය (සියයට 43.2) (වගුව 5).

වගුව 5. අදහස් ප්‍රකාශ කිරීමේ/සහභාගිවීමේ නිදහස පිළිබඳ වත්මන් තත්ත්වය ඇගයීම, ජන වර්ගය අනුව

| | | ජාතික | සිංහල | දෙමළ | උඩරට දෙමළ | මුස්ලිම් |
|---|---|---|---|---|---|---|
| ඔබ සිටින ස්ථානය සහ ඔබ සමග සිටින්නේ කවුරුන්ද යන්න නොසලකා දේශපාලනය පිළිබඳ ඔබේ අදහස් ප්‍රකාශ කිරීමට | සම්පූර්ණයෙන් නිදහස් | 27.2% | 35.3% | 11.1% | 10.0% | 39.8% |
| | තරමක් නිදහස් | 53.7% | 51.5% | 57.6% | 66.0% | 46.6% |
| | කිසිදු නිදහසක් නැත | 17.8% | 11.4% | 31.3% | 22.0% | 12.5% |
| සමාජ අසාධාරණයට (ජීවන වියදම ඉහළ යාම, බස් ගාස්තු වැඩි කිරීම ආදිය) එරෙහි උද්ඝෝෂණයකට / විරෝධතාවයකට සහභාගී වීමට | සම්පූර්ණයෙන් නිදහස් | 26.7% | 32.9% | 21.2% | 12.0% | 29.5% |
| | තරමක් නිදහස් | 55.4% | 55.1% | 50.5% | 72.0% | 52.3% |
| | කිසිදු නිදහසක් නැත | 15.3% | 8.4% | 28.3% | 16.0% | 13.6% |
| ඔබේ ආගම සහ එහි සාම්ප්‍රදායික සිරිත් විරිත් අනුගමනය කිරීමට | සම්පූර්ණයෙන් නිදහස් | 47.5% | 75.4% | 32.3% | 50.0% | 10.2% |
| | තරමක් නිදහස් | 36.1% | 20.4% | 51.5% | 44.0% | 44.3% |
| | කිසිදු නිදහසක් නැත | 15.3% | 3.0% | 16.2% | 6.0% | 43.2% |
| සමස්ත ප්‍රතිචාරකයන් සංඛ්‍යාව | | 404 | 167 | 99 | 50 | 88 |

අදහස් ප්‍රකාශ කළ මතධාරී නායකයින්ගෙන් හතරෙන් තුනකට වඩා (සියයට 86.4) ප්‍රකාශ කරන ලද්දේ යම් ප්‍රදේශයක බහුතර ප්‍රජාවේ එකඟත්වයක් නොමැති වුවද සුළුතර කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු බවයි. මෙම ප්‍රකාශය සමග එකඟ වූ අය අතුරෙන් වැඩි ප්‍රමාණයක් සුළුතර කණ්ඩායම්වල නියෝජනය කරමින් ප්‍රතිචාර දැක්වූවන් වූහ (සියයට 93.9-98.9) (රූප සටහන 21).

රූප සටහන 21. බහුතර ප්‍රජාවේ එකඟත්වයක් නොමැති වුවද සුළුතර කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය, ජන වර්ගය අනුව



බලය බෙදීම සම්බන්ධයෙන් ගත් කළ, සියලු මතධාරී නායකයින්ගෙන් (සියයට 52 කට ආසන්න) බහුතරයක් ප්‍රකාශ කර සිටියේ පළාත් සභාවල බලතල වැඩි කළ යුතු බවයි. මෙම අදහස වැඩි වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ දෙමළ (සියයට 85.9) සහ මුස්ලිම් (සියයට 72.7) ප්‍රජාවන්ට අයත් මතධාරී නායකයින් විසිනි. මෙම මතයට බොහෝ විට විරුද්ධ වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලද්දේ සිංහල මතධාරී නායකයින් (සියයට 52.7) මඟිනි (වගුව 6).

වගුව 6. බලය බෙදීම, ජන වර්ගය අනුව

| | ජාතික | සිංහල | දෙමළ | උඩරට දෙමළ | මුස්ලිම් |
|---|---|---|---|---|---|
| පළාත් සභාවන්හි බලතල වැඩි කළ යුතුය. | 51.7% | 15.6% | 85.9% | 68.0% | 72.7% |
| පළාත් සභාවන්හි බලතල වැඩි නොකළ යුතුය | 28.0% | 52.7% | 4.0% | 16.0% | 14.8% |
| ඒ දෙකම නොවේ | 12.6% | 21.6% | 5.1% | 6.0% | 8.0% |
| සමස්ත ප්‍රතිචාරකයන් සංඛ්‍යාව | 404 | 167 | 99 | 50 | 88 |

දේශපාලන නියෝජනය සම්බන්ධයෙන් විමසීමේ දී, සෑම ජනවාර්ගික කණ්ඩායමකටම ඔවුන්ගේ ජනවර්ග යෙහි ජනගහනයට සමානුපාතිකව නිශ්චිත සංඛ්‍යාවක් පාර්ලිමේන්තුවට තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතු යැයි සමස්තයක් ලෙස සියලුම මතධාරී නායකයින්ගෙන් බහුතරයක් (සියයට 72.5) ප්‍රකාශ කරන ලදී.

රාජ්‍ය නිලධාරීන් තම ජනවාර්ගිකත්වය හෝ ආගම නියෝජනය කිරීම වැදගත් බව පෙන්වා දීමේ වැඩි නැඹුරුතාවයක් දෙමළ (සියයට 63.6) සහ මුස්ලිම් (සියයට 53.4) ප්‍රජාවන් නියෝජනය කළ මතධාරී නායකයින් තුළින් දිස් විය.

ශ්‍රී ලංකාව වැනි රටකට ජනවාර්ගික හෝ ආගම පදනම් කරගත් දේශපාලන පක්ෂ තිබීම ගැටලුවක් බව සියලු ජනවාර්ගික ප්‍රජාවන්හි (සියයට 60.1) බහුතරයක් වූ මතධාරී නායකයින් විසින් පෙන්වා දුනි (වගුව 7).


වගුව 7. දේශපාලනික නියෝජනය, ජන වර්ගය අනුව

| | එකඟ වේ | | | | |
|---|---|---|---|---|---|
| | ජාතික | සිංහල | දෙමළ | උඩරට දෙමළ | මුස්ලිම් |
| සෑම ජනවාර්ගික කණ්ඩායමකට ම ඔවුන්ගේ ජනවර්ගයෙහි ජනගහනයට සමානුපාතිකව නිශ්චිත සංඛ්‍යාවක් පාර්ලිමේන්තුවට තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතුය | 72.5% | 55.7% | 89.9% | 78.0% | 81.8% |
| මහජන නියෝජිතයන් මගේ ජනවාර්ගිකත්වය / ආගම නියෝජනය කිරීම මට වැදගත්ය. (සටහන: රාජ්‍ය නිලධාරීන් යන්නෙන් නගර සභාවට/මහ නගර සභාවට/ප්‍රාදේශීය සභාවට සහ පාර්ලිමේන්තුවට තේරීපත් වන සියලු මහජන නියෝජිතයන් අදහස් කෙරේ) | 50.2% | 46.1% | 63.6% | 32.0% | 53.4% |
| ශ්‍රී ලංකාව වැනි රටකට ජනවාර්ගික / ආගම පදනම් කරගත් දේශපාලන පක්ෂ තිබීම ගැටලුවක් යැයි මම සිතමි. | 60.1% | 75.4% | 53.5% | 50.0% | 44.3% |
| සමස්ත ප්‍රතිචාරකයන් සංඛ්‍යාව | 404 | 167 | 99 | 50 | 88 |

## සමාජ ආර්ථික හිමිකම්


බොහෝ මතධාරී නායකයින් ප්‍රකාශ කළේ තමන්ට රැකියා සහ/හෝ ආර්ථික කටයුතු සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි බවයි. ඊට පටහැනි මතයක් ප්‍රකාශ කරන ලද්දේ උඩරට දෙමළ (සියයට 44) සහ මුස්ලිම් (සියයට 40.9) ප්‍රජාවන්ගේ ප්‍රතිචාරකයන් විසිනි (රූප සටහන 22).

රූප සටහන 22. රැකියාවන්/ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ප්‍රවේශය, ජන වර්ගය අනුව





අදහස් දැක් වූ මතධාරී නායකයින් බහුතරයක් (සියයට 91.6) විසින් ප්‍රකාශ කරන ලද්දේ සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා පහසු ප්‍රවේශයක් ඇති බව වන අතර; ඊට පටහැනි අදහසක් දක්වා ඇත්තේ ප්‍රතිචාරකයන්ගෙන් සියයට 8.2 ක් පමණි. සෞඛ්‍ය සේවා ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීම කිසිසේත් පහසු කාර්යයක් නොවන බව බොහෝ දුරට පෙන්වා දෙන ලද්දේ උඩරට දෙමළ ප්‍රජාව නියෝජනය කරමින් (සියයට 12) ප්‍රතිචාර දැක්වූ මතධාරී නායකයන්ය (රූප සටහන 23).

රූප සටහන 23. සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය, ජන වර්ගය අනුව




අධ්‍යාපන සේවාවන් ලබා ගැනීම පහසු බව බහුතර ප්‍රතිචාරකයන් ප්‍රමාණයක් (සියයට 92.4) ප්‍රකාශ කරන ලදී. අධ්‍යාපනයට අදාළ සේවාවන් ලබා ගැනීමේ දී දුෂ්කරතාවන්ට මුහුණ දීමට තමන්ට සිදුවන බව පැවසීමේ වැඩි ප්‍රවණතාවයක් දෙමළ ප්‍රජාවගේ නියෝජනය කරන ලද මතධාරී නායකයන් තුළින් (සියයට 10) වාර්තා වුණි (රූප සටහන 24).

රූප සටහන 24. අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, ජන වර්ගය අනුව



# 6. අධිකරණය සම්බන්ධ තත්ත්වය


මෙම සමීක්ෂණ මගින් අධිකරණයෙහි සහ නීතිය හා සාමය ආරක්ෂා කරන ආයතනයන්හි සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සහ ස්වාධීනත්වය සම්බන්ධයෙන් පවතින මතවාදයන් පිළිබඳව විමසීමට ලක් කරන ලදී.

## නීතිය හා සාමය පවත්වාගෙන යාම

රටේ නීතිය හා සාමය පවත්වා ගෙන යන ආකාරය පිළිබඳව අතෘප්තිමත් බව මතධාරී නායකයින්ගෙන් බහුතරයක් (සියයට 55 ක්) ප්‍රකාශ කළ අතර සියයට 14 කට ආසන්න ප්‍රතිචාරකයන් සංඛ්‍යාවක් ඒ සම්බන්ධයෙන් තමන් තෘප්තිමත් වන බව සඳහන් කරන ලදී. ප්‍රතිචාරකයන්ගෙන් තුනෙන් එකක් පමණ (සියයට 30.2) නීතිය හා සාමය පවත්වාගෙන යන ආකාරය පිළිබඳව තමන් තෘප්තිමත් හෝ අතෘප්තිමත් නොවන බව සඳහන් කරන ලදී.

මෙම ප්‍රශ්නයෙන් සම්බන්ධයෙන් වැඩිම අතෘප්තිමත්භාවයක් පෙන්නුම් කිරීමේ ප්‍රවණතාවයක් මුස්ලිම් මතධාරී නායකයන් (සියයට 72.7) තුළින් දිස් වූ අතර, එකී මතය දැරූ අනෙකුත් ජනවර්ගයන් අතර උඩරට දෙමළ (සියයට 54), සිංහල (සියයට 50.3) සහ දෙමළ (සියයට 47.5) වශයෙන් වාර්තා විය. සිංහල ප්‍රජාව නියෝජනය කරන ලද මතධාරී නායකයන් එකී කරුණ සම්බන්ධයෙන් තමන් තෘප්තිමත් වන බවට අදහස් දැක්වීමේ වැඩි නැඹුරුතාවයක් පෙන්නුම් කෙරුණි (සියයට 17.4) (රූපය 25).


රූප සටහන 25. නීතිය හා සාමය පිළිබඳ තෘප්තිමත්භාවය, ජන වර්ගය අනුව




## ස්වාධීනත්වය

සමීක්ෂණයට ලක් කළ මතධාරී නායකයින්ගෙන් හතරෙන් එකකට (සියයට 22.3) ආසන්න සංඛ්‍යාවක් ප්‍රකාශ කර සිටියේ ශ්‍රී ලංකාවේ උසාවි සහ විනිසුරුවන් කිසිසේත් ස්වාධීන නොවන බවයි. අධිකරණය සම්පුර්ණයෙන්ම ස්වාධීන යැයි පෙන්වාදෙන ලද්දේ ප්‍රතිචාරකයන්ගෙන් සියයට 13 ක් පමණි. ජනවාර්ගික ප්‍රජාවන් හතරම නියෝජනය කරමින් මතධාරී නායකයන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කරන ලද්දේ මෙරට උසාවි සහ විනිසුරුවරුන් තරමක් ස්වාධීන බවයි (රූප සටහනය 26).


රූප සටහන 26. අධිකරණයෙහි ස්වාධීනත්වය, ජන වර්ගය අනුව




## කාර්ය පටිපාටික යුක්තිය


තමන්ගේ ජනවර්ගය හෝ ආගම කුමක් වුවද ඒ පිළිබඳ වෙනස් කොට නොසලකමින් ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය (උසාවි සහ විනිසුරුවන්) මගින් ඔවුන්ට සාධාරණව සලකණු ඇතැයි සිතන්නේ ද යන ප්‍රශ්නය ප්‍රතිචාරකයන්ගෙන් විමසූ විට, ඔවුන්ගෙන් අඩකට ආසන්න (සියයට 47.3 ක්) ප්‍රමාණයක් ප්‍රකාශ කර සිටියේ තමන්ට අවම වශයෙන් තරමක් දුරට සාධාරණව සලකනු ඇති බවයි. මතධාරී නායකයින්ගෙන් හතරෙන් එකක් විසින් පෙන්වාදෙන ලද්දේ ඔවුන්ගේ ජනවාර්ගික හා ආගම හේතුවෙන් ඔවුන්ට කිසිසේත් සාධාරණ ලෙස සලකනු ලබන්නේ නැති බව ඔවුන්ගේ අදහස බවයි (රූප සටහන 27).

රූප සටහන 27. ජනවර්ගය හෝ ආගම කුමක් වුවද සාධාරණ ලෙස සැලකීම, ජන වර්ගය අනුව





සමීක්ෂණයට සහභාගී වූ මතධාරී නායකයන්ගෙන් පැහැදිලි බහුතරයක් (සියයට 59.4) ප්‍රකාශ කරන ලද්දේ අපරාධ චෝදනාවන්ට ලක් වූවන් පාලක දේශපාලන පක්ෂයක සාමාජිකයින් වන්නේ නම් ඔවුන්ට සාධාරණව සලකනු ලැබිය හැකි බවයි. එසේ නමුත් එවන් චෝදනා ලද තැනැත්තකු විරුද්ධ පක්ෂ සාමාජිකයකු වන්නේ නම් එලෙස සාධාරණව සලකනු ලබනු ඇතැයි යන අදහසෙහි සිටි ප්‍රතිචාරකයන්ගේ ප්‍රමාණය සියයට 30.7 ක් දක්වා අඩු මට්ටමකට පහළ ගිය අතර එවන් චූදිත පුද්ගලයෙකු ආර්ථික වශයෙන් දුගී පසුබිමක් ඇත්තකු නම් එවැන්නෙකුට සාධාරණ ලෙස සලකනු ලබනු ඇතැයි සිතන පිරිස සියයට 27.2 ක් දක්වා අඩු වූ බව පෙන්නුම් කෙරුණි. සන්සන්දනාත්මකව බලන කල, මතධාරී නායකයන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක (සියයට 49.3) අදහස වූයේ බහුතර ජනවාර්ගික ප්‍රජාව නියෝජනය කරනු ලබන පුද්ගලයන් සම්බන්ධයෙන් සාධාරණව කටයුතු කරනු ඇති බවය. ඊට සමගාමීව බලන විට සුළුතර ජනවාර්ගික ප්‍රජාවක සාමාජිකයින් සම්බන්ධයෙන් සාධාරණව සලකනු ලබනු ඇතැයි විශ්වාස කළ ප්‍රතිචාරකයන් සියයට 32.9 ක් ද ආගමික සුළුතරයන් සඳහා සාධාරණව සලකනු ලබනු ඇති බවට විශ්වාසය පළ කරන්නන් සියයට 33.9 ක් ද සිටින ලදී.


රූප සටහන 28. අපරාධ චෝදනාවන්ට ලක් වූවන්ට සලකනු ලැබිය හැකි ආකාරය, ජන වර්ගය අනුව





රූප සටහන 29. අපරාධ චෝදනාවන්ට ලක් වූ පාලක පක්ෂයන්හි පුද්ගලයන්ට සලකනු ලැබිය හැකි ආකාරය, ජන වර්ගය අනුව





රූප සටහන 30. අපරාධ චෝදනාවන්ට ලක් වූ විරුද්ධ පක්ෂයක පුද්ගලයන්ට සලකනු ලැබිය හැකි ආකාරය, ජන වර්ගය අනුව




රූප සටහන 31. අපරාධ චෝදනාවන්ට ලක් වූ සුළුතර ජනවාර්ගික ප්‍රජාවක පුද්ගලයන්ට සලකනු ලැබිය හැකි ආකාරය, ජන වර්ගය අනුව





රූප සටහන 32. අපරාධ චෝදනාවන්ට ලක් වූ සුළුතර ආගමික ප්‍රජාවක පුද්ගලයන්ට සලකනු ලැබිය හැකි ආකාරය, ජන වර්ගය අනුව




රූප සටහන 33. අපරාධ චෝදනාවන්ට ලක් වූ ආර්ථික වශයෙන් දුගී පසුබිමක පුද්ගලයන්ට සලකනු ලැබිය හැකි ආකාරය, ජන වර්ගය අනුව



රූප සටහන 34. අපරාධ චෝදනාවන්ට ලක් වූ බහුතර ජනවාර්ගික ප්‍රජාවක පුද්ගලයන්ට සලකනු ලැබිය හැකි ආකාරය, ජන වර්ගය අනුව



# පාර්ශවකරුවන්

## ජාත්‍යන්තර IDEA ආයතනය

ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ සහයෝගීතාවය සඳහා වන ජාත්‍යන්තර ආයතනය [International Institute for Democracy and Electoral Assistance (International IDEA)] හෙවත් ජාත්‍යන්තර IDEA ආයතනය යනු විශ්වීය මානව අභිලාෂයක් ලෙස තිරසාර සංවර්ධනය සක්‍රීයත්වයට පත් කරන්නෙකු ලෙස සහ ලොව පුරා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීමේ මෙහෙවරෙහි යෙදී ඇති අන්තර් රාජ්‍ය සංවිධානයකි. අපි මෙය සිදු කරනු ලබන්නේ සෑම මට්ටමකම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ආයතන සහ ක්‍රියාවලීන් ගොඩනැගීමට, ශක්තිමත් කිරීමට සහ ආරක්ෂා කිරීමට සහාය වීමෙනි. අපගේ දැක්ම යනු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන්, ක්‍රියාකාරීන් සහ ආයතන අන්තර්කරණයෙන් යුත් හා වගකිව යුතු මෙන්ම සියලු දෙනාටම තිරසාර සංවර්ධනය ලබා දෙන ලෝකයකි.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සඳහා වූ එඩින්බරෝ කේන්ද්‍රය (ECCL)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය නීතිය සඳහා වන එඩින්බරෝ කේන්ද්‍රය එක්සත් රාජධානියේ සහ ස්කොට්ලන්තයේ පොදු නීතිය, සංසන්දනාත්මක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සහ ව්‍යවස්ථාමය න්‍යාය පිළිබඳ පර්යේෂණ සඳහා එඩින්බරෝ විශ්ව විද්‍යාලයේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වේ. මෙම කේන්ද්‍රයෙහි සාමාජිකයින්ගේ පර්යේෂණ හා උපදේශන කටයුතු හරහා එක්සත් රාජධානිය, යුරෝපය, පොදුරාජ්‍ය මණ්ඩලය සහ ඉන් ඔබ්බට ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වර්ධනයන් පිළිබඳව සාකච්ඡාවට බඳුන් කරනු ලබයි. මෙම කේන්ද්‍රයට පොදු නීතිය, ජාත්‍යන්තර නීතිය සහ නීති න්‍යාය මෙන්ම ඉතිහාසය හා සංසන්දනාත්මක දේශපාලනය යන ක්ෂේත්‍රයන්හි කටයුතු කරනු ලබන කාර්ය මණ්ඩලය සහ සිසුන් ඇතුළු පුළුල් සාමාජිකත්වයක් ඇත.

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනයː නො. 6/5, ලේයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථනː +94 (11) 2081384-6
ෆැක්ස්ː +94 (11) 2081388
වෙබ්ː www.cpalanka.org

## සෝෂල් ඉන්ඩිකේටර්

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (සීපීඒ) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමඟින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවති රික්තයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටලු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනය: නො. 6/1B, 1/1, ලේයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2584050
වෙබ්: http://cpalanka.org/survey-research/
විද්‍යුත් තැපැල: sakina@cpasocialindicator.org

''ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විෂය පථය සහ අන්තර්ගතය: මතධාරී නායකයින්ගේ අදහස්" නම් වූ වාර්තාවෙහි දිවයින පුරා විසිරී සිටින ප්‍රධාන වාර්ගික ප්‍රජාවන් හතරේ (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) නායකයින්ගේ දැනුම, ආකල්ප සහ මතවාදයන් ඇගයීම පිළිබඳ අධ්‍යනයෙන් ඉස්මතු වූ සොයාගැනීම්වල සාරාංශයක් අන්තර්ගත වේ. මෙම නායකයින් අතරට ආගමික නායකයින්, රාජ්‍ය නිලධාරීන්, ප්‍රජා මූල සංවිධානවල නිලතල දරන්නන්, ගුරුවරුන් සහ පාසල් විදුහල්පතිවරුන් ඇතුළත් විය. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ ව්‍යවස්ථාමය සන්දර්භය සහ යතාර්ථයන්, දේශපාලනික පර්යාය, ජනාධිපති ධුරය, ආර්ථිකයේ සහ මානව හිමිකම් පිළිබඳ ස්වභාවය ආදී තත්වයන් සම්බන්ධයෙන් මෙකී මතධාරී නායකයන්ගේ අදහස් එක්රැස් කිරීම උදෙසා මැතිවරණ සහයෝගීතාවය සඳහා වන අන්තර්ජාතික ආයතනය හෙවත් ජාත්‍යන්තර IDEA ආයතනයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඇගයීමේ ක්‍රමවේදය අනුවර්තනය කර අදාළ කර ගෙන තිබේ. විකල්ප ප්‍රතිපත්ති  කේන්ද්‍රය (CPA), මැතිවරණ සහයෝගීතාවය සඳහා වන අන්තර්ජාතික ආයතනය හෙවත් ජාත්‍යන්තර IDEA ආයතනය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සඳහා වු එඩින්බරෝ කේන්ද්‍රය (ECCL) සමඟ ඒකාබද්ධව මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කාර්යසාධන ඇගයීම සිදුකරන ලදී.

**International IDEA**
Strömsborg
SE-103 34 Stockholm
Sweden
Telephone: +46 8 698 37 00
Email: info@idea.int
Website: <https://www.idea.int>

**Edinburgh Centre for Constitutional Law**
School of Law
University of Edinburgh
Old College, South Bridge
Edinburgh EH8 9YL
Telephone: +44 01316502008

**Centre for Policy Alternative**
6/5, Layards Road
Colombo 5
Sri Lanka
Telephone: +94(11)2 081384-6
Website: <http:/ www.cpalanka.org>

**Social Indicator**
No: 6/ 1B , 1/1, Layards Road
Colombo 05
Sri Lanka
Telephone: +94112 584050

ISBN: 978-91-7671-516-1 (PDF)